හොරොව්පොතාන ප්‍රාදේශීය සභාව
අනුරාධපුර දිස්ත්‍රික්කය
-----------------------------------

01. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 13 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 අගෝස්තු 21 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 14 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 ව්‍යාවනය කළ මතය
-----------------------

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

1.3 ව්‍යාවනය කළ මතය සඳහා පදනම
-------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ විමධ්‍යගත ව්‍යාපෘති 16 ක් සඳහා රු.8,624,400 ක් වැය කිරීම ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තු පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | සභාව විසින් දරන ලද ප්‍රාග්ධන වැය, ප්‍රාග්ධන වියදම් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.62,512,322 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි 08 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | සභාවට අයත් සියළුම වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතුව තිබුණු රු.57,446,247 ක් වූ මෝටර් රථ 08 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | සභාවට අයත් සියළුම වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | වටිනාකම අනාවරණය නොවූ මෝටර් රථ 07 ක් තක්සේරුකර ගිණුම්ගත කර නොතිබුණි. | සභාවට අයත් සියළුම වත්කම්වල වටිනාකම තකසේරු කර ගිණුම්ගත කිරිමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |
| (v) | සභාවට අයත් නීල හරිත උද්‍යානය පිහිටි ඉඩමේ වටිනාකම සහ එම භූමියේ ඉදිකර සභාවට පවරාදී තිබුණු ගොඩනැගිලිවල වටිනාකම් ගිණුම්ගත කර නොතිබුණි. | සභාවට අයත් සියළුම වත්කම්වල වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |
| (vi) | සමාලෝචිත වර්ෂයේ මිලට ගෙන තිබුණු රු.35,500 ක් වූ ඇඟිලි සලකුණු යන්ත්‍රයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | සභාවට අයත් සියළුම වත්කම්වල වටිනාකම ගිණුම්ගත කිරිමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |

(ආ) අසම්භාව්‍ය බැරකම්
----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට සභාවට එරෙහිව බාහිර පාර්ශවයන් 02 ක් හා සභාව විසින් බාහිර පාර්ශවයකට පවරා තිබුණු නඩු පිළිබඳව තොරතුරු මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි. | අසම්භාව්‍ය බැරකම් පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළයුතු වේ. | පිළිගනිමි. |

(ඇ) නොසැසඳුණු ගිණුම්
--------------- ------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 06 ක මූල්‍ය ප්‍රකාශන අනුව හා ලේඛන ප්‍රකාර වටිනාකම් අතර රු.136,497 ක එකතු වෙනසක් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. | මූල්‍ය ප්‍රකාශනවලට අනුව ශේෂයන් නිවැරදි අතර ලේඛන පිළියෙල කිරීමේදී සිදුවී ඇති අතපසුවීම් නිසා වෙනස පෙන්නුම් කරන අතර ලේඛන නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

(ඇ) ලැබිය යුතු ගිණුම්

| විගණනන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.6,719,851 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 02 ක් වසර 01 සිට වසර 20 ක් දක්වා කාලයක සිට අය කරගෙන නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |

(ඉ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වටිනාකම රු.9,631,482 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාළව පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. | පිළිගනිමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ රු.45,913,746 ක් වටිනා ආදායම් විෂයයන් 25 ක් හා රු.61,039,452 ක් වටිනා වියදම් විෂයන් 34 ක් ප්‍රධාන ලෙජරයේ ගිණුම්වලට මාරුකිරීම්වලට ජ'නල් සටහන් ඉදිරිපත් කර නොතිබුණි. | අදාල පරිදි අවශ්‍ය සියළුම ජ'නල සටහන් සහ ගිණුම් ඉදිරිපත් කළයුතු වේ. | පිළිගනිමි. |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති සංග්‍රහය | | | |
| | (i) රීති 33 | වරිපනම් ගෙවීම පැහැරහරින පුද්ගලයන් පිළිබඳව ලැයිස්තුවක් සහ දේපල තහනම් කිරීමේ වරෙන්තු එක් එක් කාර්තුව අවසානයේදී පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | රීති 59 | සභා බල ප්‍රදේශයේ ව්‍යාපාර හා කර්මාන්ත බදු සම්බන්ධයෙන් සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |
| (iii) | රීති 217 හා 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් ප්‍රා.ස.46 ආකෘතිය ප්‍රකාරව ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර සියළු ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් පරික්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |
| (ආ) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ චක්‍රලේඛ<br>----------------------- | | | |
| (i) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 | සභාව සතු වාහන 07 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | අදාල චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |
| (ii) | 2009 ජුනි 17 දිනැති අංක 09/2009(I) | ඇඟිලි සළකුණු කිරීමේ යන්ත්‍ර ස්ථාපිත කර නොතිබුණි. | අදාල චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.9.1 ඡේදය | රැස්වන එක් කමිටුවකදී ගන්නා ලද ප්‍රසම්පාදන තීරණ ප්‍රමාණය ප්‍රසම්පාදන දීමනා ගෙවීම සඳහා එක් කමිටුවක් ලෙස සැලකිය යුතු වුවත් දින 04 කදී පැවති තීරණ 17 ක් සඳහා තීරණ සංඛ්‍යාව පදනම්ව දීමනා ගෙවීම නිසා රු.76,250 ක අධිගෙවීමක් සිදුව තිබුණි. | අදාල චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |

2. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.11,375,770 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.23,070,993 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් ,බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,872,800 | 1,371,822 | 1,381,777 | 1,216,884 | 1,326,400 | 1,511,392 | 1,343,325 | 1,226,839 |
| (ii) | කුලී | 5,102,768 | 4,650,229 | 3,985,243 | 7,696,981 | 5,074,600 | 3,851,465 | 3,546,771 | 7,051,995 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 606,000 | 412,320 | 412,320 | 1,033,300 | 713,000 | 484,050 | 484,050 | 1,033,300 |
| (iv) | වෙනත් ආදායම් | 32,937,250 | 8,950,333 | 12,542,196 | 1,472,605 | 28,053,940 | 51,240,865 | 49,658,263 | 5,064,468 |
| | එකතුව | 40,518,818 | 15,384,704 | 18,321,536 | 11,419,770 | 35,167,940 | 57,087,772 | 55,032,409 | 14,376,602 |

### 2.2.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට සභා බල ප්‍රදේශයේ මාර්ග 09 කට අයත් දේපළ 258 කින් රු.148,984 ක වරිපනම් බදු මුදලක් අයවිය යුතුව පැවතුණි. | හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | 1994 වරිපනම් තක්සේරුවක් බැවින් හඳුනා ගත නොහැකි දේපල 50% ක් පමණ පවතින බැවින් වරිපනම් අයකර ගැනීමට නොහැකි වීම නිසා රු.148,984 හිඟයක් ඇතිවී තිබෙන අතර නව වරිපනම් තක්සේරුවක් සඳහා මේ වන විට පළාත් පාලන ආයතනය වෙත යොමු කර ඇත. |
| (ආ) | 1994 වර්ෂයේ තක්සේරුව පදනම්ව වරිපනම් අයකරමින් තිබුණි. | වසර 05 කට වරක් වරිපනම් බදු තක්සේරු කළයුතු වේ. | නව වරිපනම් තක්සේරුවක් සඳහා මේ වනවිට පළාත් පාලන ආයතනය වෙත යොමු කර ඇත. |

2.2.3 කුලී

----

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------------- | ------------- | ----------------------------- |
| (අ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1980/46 සහ 1980 දෙසැම්බර් 31 දිනැති පළාත් පාලන චක්‍රලේඛය පරිදි වසර 05 කට වරක් දේපල තක්සේරු කල යුතු වුවද 1994 වර්ෂයේ තක්සේරුව පදනම්ව සභාව සතු කඩ කාමර 22 ක් සඳහා ගාස්තු අයකර තිබුණි. | චක්‍රලේඛය පරිදි වසර 05 කට වරක් දේපල තක්සේරු කළයුතු අතර එම නව තක්සේරුව පනවා ගාස්තු අය කිරීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදි දේපල තක්සේරුවක් මගින් කඩකාමර සඳහා ගාස්තු අය කිරීමට කටයුතු කරමි. |
| (ආ) | පොදු වෙළඳපොළ කඩ කාමර අංක 4,8,9 හා 10 හැර ඉතිරි සියළු කඩ කාමර සඳහා 1994 වර්ෂයේදී ගිවිසුම් අත්සන් කර තිබුණු අතර ගිවිසුම් අලුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | නව තක්සේරුවක් මත පදනම්ව ගිවිසුම් අළුත් කිරීමට කටයුතු කළයුතු වේ. | නව තක්සේරුවක් මගින් කඩ කාමර ගිවිසුම් අලුත් කිරීමට කටයුතු කරමි. |

2.2.4 බලපත්‍ර ගාස්තු

---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ------------- | -------------------------- |
| 2018 පෙබරවාරි 01 දිනැති අංක 1534/18 දරන ගැසට් පත්‍රයේ iii වන උපලේඛනයේ සඳහන් පරිසර බලපත්‍ර නිකුත් කිරීම සිදුකල යුතු ආයතන විශාල ප්‍රමාණයක් ඇතත් ආයතන 10 ක් සඳහා පමණක් පරිසර බලපත්‍ර නිකුත් කර තිබුණි. | පරිසර බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත හඳුනා ගෙන ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |

2.2.5 වෙනත් ආදායම්

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------------- | --------------------------- |
| සමාලෝචිත වර්ෂය තුළදී කසළ ගාස්තු ලෙස අයවී තිබුණු මුදල රු.272,600 ක් පමණක් වූ අතර දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟය රු.1,067,200 ක් විය. | අයවිය යුතු හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව වු නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු නමුත් 2019 දෙසැම්බර් 31 දිනට අදාළ කාරණා සම්බන්ධව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළයුතු වේ. | අතුරු ව්‍යවස්ථා පැනවීම සඳහා පොදු ක්‍රමවේදයක් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ලබා දීමට ඉදිරියේදි කටයුතු කරන බව ප්‍රගති සමාලෝචන රැස්වීමේ දී සඳහන් කරන ලදි. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එක්සත් ජාතින්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව සමාලෝචිත වර්ෂය තුළදී ද දැනුවත් වී නොතිබුණි. | එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍ර ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. ඉදිරියේදි තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනිම සඳහා ඉලක්ක සහගත වැඩපිළිවෙලක් සකස් කිරීමට කටයුතු කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | ගොඩනැගිලි සැළසුම් අනුමත කර තිබුණද අනුකූලතා සහතික කිසිවක් නිකුත් කර නොතිබුණි. | අනුමත කළ අදාල සැලසුම් සඳහා පසුවිපරමත් මගින් අනුකූලතා සහතික නිකුත් කිරීමට කටයුතු සිදුකළයුතු වේ. | පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාවට අයත් පොදු වෙළඳපල කඩ කාමර 09 ක් වර්ෂ 08 කට අධික කාලයක සිට අලුත්වැඩියා කිරීම් සිදුකර බදුදීමට කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට සභාවට රු.840,000 ක තක්සේරුගත අලාභයක් සිදුවී තිබුණි. | අදාල කඩ කාමර අළුත්වැඩියා කර ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |
| (ඇ) | තත්කාර්ය අත්තිකාරම් කාර්ය නිමවූ විගස පියවීම් කලයුතු වුවද 2017 හා 2018 වර්ෂවල ලබාදුන් අත්තිකාරම් මුදල් රු.149,400 ක් මාස 06 සිට වසර 02 ක කාල පමාවක් සහිතව පියවා තිබුණි. | තත්කාර්ය අත්තිකාරම් අදාල කාර්යය නිමවූ විගසම පියවීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |

3.3 වත්කම් කළමනාකරණය

3.3.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව සතු සුසානභූමි හා අනෙකුත් ඉඩම් හඳුනාගෙන වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | සියළුම වත්කම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කළයුතු වේ. | පිළිගනිමි. ප්‍රාදේශීය සභාව සතු සුසාන භූමි හා ඉඩම් සම්බන්ධයෙන් මැනීම් කටයුතු කර ඇති අතර එම ඉඩම් පවරා ගැනීම සඳහා අදාල ආයතන වෙත යොමු කර ඇත. |

3.3.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දින වන විට සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 11 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සියළු වත්කම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |

### 3.3.3 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2016 වර්ෂයේදී ලැබී තිබූ රු.2,175,000 ක් වටිනා ෆෝටෝන් වර්ගයේ ට්‍රැක්ටරය මේ දක්වා කිසිදු ප්‍රයෝජනයකට නොගෙන සභා පරිශ්‍රයේ ගාල්කර තිබුණි. | සභාව සතු සියළුම වත්කම් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. RD- 9395 දරන ෆොටොන් ට්‍රැක්ටරය අළුත්වැඩියා කිරීම් තත්ත්වයේ පවතින අතර කසළ ඇදීම සඳහා යොදා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | සභා පරිශ්‍රයේ රඳවා තිබෙන අක්‍රීය තත්ත්වයේ පවතින වාහන 07 ක් අළුත්වැඩියා කර භාවිතයට ගැනිමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | සභාව සතු සියළුම වත්කම් උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. මෙම වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කරනු ලබන අතර ඉන්පසු එම වාහන අපහරණයට අදාල කටයුතු සිදු කරමි. |

## 04. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ 2015 මාර්තු 18 දිනැති අංක 04/2015 දරන චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව සෘජුවම වගකියනු ලබන අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර වාර්තා ලබාගෙන නොතිබුණි. | අදාල චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර වාර්තා ලබාගැනීමට කටයුතු කළයුතු වේ. | අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර ඇත. |

### 4.2 විගණන හා කළමණාකරන කමිටු ක්‍රියාත්මක කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2016 ජනවාරි 28 දිනැති DMA/2009(1)(i) දරන කළමනාකරණ හා විගණන චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව විගණන කළමනාකරණ කමිටු පැවැත්වීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |